# මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2019

# Primary Piriven First Term Test - 2019

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**4 ශ්‍රේණිය**

**ත්‍රිපිටක ධර්මය**

කාලය : පැය 03
Time :

**I කොටසේ ප්‍රශ්න සියල්ලටම ද, II III කොටස් වලින් තෝරා ගත් ප්‍රශ්න 04 ක් ද ඇතුලත්ව සියල්ම ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

**I කොටස**

1)

i. ත්‍රිවිද්‍යා නම් කරන්න.
ii. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ලද අග තනතුර කුමක්ද?
iii. පටාචාරා තෙරණිය ලද අග තනතුර කුමක්ද?
iv. ත්‍රිපිටකය නම් කරන්න.
v. වත්තක්ඛන්ධකය අයත්වන පිටකය කුමක්ද?
vi. පඨම සාරාණීය සූත්‍රය අයත්වන නිකාට කුමක්ද2
vii. චෛතසික ධර්මවල ප්‍රධාන ලක්‍ෂණ 04 ක් නම් කරන්න්.
viii. ධම්ම පදයට අයත් වග්ග හා ගාථා කීයද?
ix. සතර සෘද්ධිපාද නම් කරන්න.
x. සප්ත බොජ්ඣංග නම් කරන්න.
xi. ත්‍රි ශික්‍ෂා නම් කරන්න.
xii. කර්‍මණ කමටහන් කීයද?
xiii. සතර ආරුප්ප යනු මොනවාද?
xiv. සංස්කාර ධර්මයන්හි ප්‍රධාන ලක්‍ෂණ තුන කුමක්ද?
xv. විනය පිටකයට අයත් ග්‍රන්ථ මොනවාද?
xvi. අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථ (ප්‍රකරණ) කීයද? ඒ මොනවාද?
xvii. සතර පරමාර්ථ ධර්ම නම් කරන්න.
xviii. මට පුතුන් ඇත - මට ධනය ඇත යන අර්ථය ඇතුළත් ධම්මපද ගාථාව කුමක්ද?
xix. පද පරම පුද්ගලයාගේ අවබෝධ ශක්තිය කෙබදුද?
xx. සතර සතිපට්ඨානය නම් කරන්න.

**III කොටස**

2)

i. විනය පැණවීමට හේතුවන ආසවට්ඨානිය ධර්ම නම් කරන්න.
ii. විනය නීති පැනවීමේ අපේක්‍ෂා දහයෙන් හයක් නම් කරන්න.
iii. විනය පිටකය පිළිබඳව කෙටි සටහනක් ලියන්න.

3)

i. සාරාණීය සූත්‍රයට අනුව පැවිද්දන් නිතර සිහි කළ යුතු ධර්ම අතුරින් 04 ක් නම් කරන්න.

ii. සුපිරිසිදු ශීලයක පැවතිය යුතු අංග කවරේද? ඉන් 04ක් නම් කරන්න.

iii. සමගි සම්පන්න භික්ෂු සමාජයක් උදෙසා සාරාණීය ධර්ම පිළිපැදීමේ වටිනාකම අගයන්න.

4)

i. චෛතසික ධර්ම (52) සියල්ල මූලික වශයෙන් බෙදෙන අයුරු විදහා දක්වන්න.

ii. ප්‍රකීර්ණක චෛතසික (06) හය නම් කරන්න.

iii. සබ්බ චිත්ත සාධාරණ චෛතික හතෙන් (07) තුනක් (03) විස්තර කරන්න.

5)

i. කර්මස්ථාන ප්‍රභේද දෙක (02) නම් කරන්න.

ii. චතු ධාතු ව්‍යවත්ථාන භාවනාව යනු කුමක්ද?

iii. දස අනුස්සති නම් කරන්න.

## III කොටස

6)

i. නව අරහාදි බුදු ගුණ නම් කරන්න.

ii. ඉන් ඔබ කැමති බුදු ගුණයක් විස්තර කරන්න.

iii. රත්නයක තිබිය යුතු විශේෂ ලක්‍ෂණ කවරේදැයි විස්තර කරන්න.

7)

i. ත්‍රිලක්‍ෂණය නම් කරන්න.

ii. අනිත්‍ය (අනිච්ච) යනු කුමක්දැයි පහදන්න.

iii. අනාත්ම (අනත්ත ) යනු කුමක්දැයි පහදන්න.

8)

i. පහත දැක්වෙන ගාථා අතුරින් දෙකක් (02) සම්පූර්ණ කරන්න.

- චරං චෙ නාධිගච්ඡෙය්‍ය.......
- යො බාලො මඤ්ඤතී බාල්‍යං.........
- මුහුත්ත මපි චෙ විඤ්ඤූ..............
- න තං කම්මං කතං සාධූ ......................

ii. ඔබ සම්පූර්ණ කළ ගාථා දෙකෙහි අර්ථ ලියන්න.

iii. ඉන් එක් ගාථාවක නිධාන කථාව ලියන්න.

9)

i. බුද්ධ කාලීන භාරතයෙහි විසූ ෂට් ශාස්තෘවරු නම් කරන්න.

ii. ඔවුන්ගේ දර්ශනවාද මොනවාද?

iii. ඉන් එක් ශාස්තෘවරයෙකු පිළිබදව කෙටි විස්තරයක් සපයන්න.